**ලංසු ආරාධනයයි. (IFB)**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

# මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

## බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලේ “ඇන්සැලරි බී” ගොඩනැගිල්ලේ බිම් මහලේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම.

IFB No. PS/03/PB/PR/09/31/25

01. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාර, සුහුරුපාය ගොඩනැගිල්ලේ ස්ථාපිත කාර්යාලයන්හි කාර්ය මණ්ඩලය හා සේවාව අපේක්ෂාවෙන් පැමිණෙන මහජනතාව වෙනුවෙන් “ඇන්සැලරි බී” ගොඩනැගිල්ලේ බිම් මහලේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

02. ආපනශාලාව පවත්වාගෙන යාම සිදුකරනු ලබන “ඇන්සැලරි බී” ගොඩනැගිල්ලේ බිම් මහලේ ප්‍රමාණය **වර්ග අඩි 4065ක්** වේ. ආපනශාලාව පැවැත්වීම සදහා **වසර 02 ක බදු කාල සීමාවක්** සඳහා ගොඩනැගිල්ල ලබා දෙන අතර, ඒ සඳහා ලංසු ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් කරන ලංසු වලංගු කාලය **2025.07.16 දින සිට 2025.10.01 දක්වා** (ලංසු විවෘත කළ දින සිට දින 77) විය යුතු ය.

03. ගිවිසුම්වලට එළඹෙන දින සිට වසර 02 ක කාලයක් සඳහා ඉදිරිපත් කරන මිල ගණන් නොවෙනස්ව පවත්වාගෙන යා යුතුය.

04. **2025.06.25 දින සිට 2025.07.15 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** කාර්යාල දිනවල රාජකාරි වේලාව තුළ, ආපසු නොගෙවන රු. 250/= ක මුදලක් මෙම අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවා ලංසු ලේඛන මුල්පිටපත හා අනු පිටපත ලබා ගත හැකිය. ගෙවීම මුදලින් පමණක් කළ යුතුය.

05. ලංසුව මුල්පිටපත හා අනු පිටපත ලෙස පිටපත් දෙකක් සහිතව **2025.07.16 දින පෙ.ව 11.00 ට හෝ ඊට පෙර** මෙම අමාත්‍යාංශයේ මූල්‍ය අංශයේ තබා ඇති ලංසු බහාලනු ලබන ලංසු පෙට්ටියට බහාලීම හෝ ලංසුව විවෘත කරනු ලබන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මිල ගණන් ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **“සුහුරුපාය ගොඩනැගිල්ලේ බිම් මහලේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම**” යන්න සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන මිල ගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන මූල්‍ය නිලධාරී,
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
17 වන මහල,
සුහුරුපාය,
බත්තරමුල්ල.

06. ලංසු භාරගැනීම අවසන් කළ වහාම ලංසු විවෘත කරනු ලැබේ. මිල ගණන් ඉදිරිපත් කළ අයට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි විය හැකිය.

07. ලංසුකරු තම ආයතනය ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචිකර තිබිය යුතු අතර, ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවේ වටිනාකම රු. මිලියන 05 ට වැඩිනම් 1987 අංක 3 දරන ප්‍රසිද්ධ කොන්ත්‍රාත් පනත යටතේ (Public Contract Act) ලියාපදිංචි වී තිබිය යුතුය. එම ලියාපදිංචි සහතිකය ලංසුව සමග ඉදිරිපත් නොකිරීම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතුවක්වනු ඇත. ලංසුකරුගේ ආයතනය ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ (National Procurement Commission) අසාදු ලේඛනයට ඇතුලත්ව නොතිබිය යුතුය. අමතර විස්තර ලංසු ලිපි ලේඛනවල සපයා ඇත.

08. සියලුම ලංසු, **රුපියල් එක්ලක්ෂ පනස් දහසක (රු.150,000/-)** ඇපකරයක් සමග ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන ඇපකරය පහත කොන්දේසි යටතේ විය යුතුය.

   i. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන දේශීය වාණිජ බැංකුවක් වෙතින් ලබාගත් ඇපකරයක් විය යුතුය.

   ii. ලංසු ඇපකර ආකෘති පත්‍රය ලංසු ලේඛනයේ ඇතුළත් පෝරමය පරිදි විය යුතුය.

   iii. ලංසු ඇපකරය ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය “Secretary, Ministry of Public Security and Parliamentary Affairs” නමින් විය යුතුය.

   iv. ලංසු ඇපකරයේ වලංගු කාලය **2025.07.16 දින සිට 2025.10.29 දින දක්වා** විය යුතුය. (ලංසු විවෘත කළ දින සිට දින 105)

09. තෝරාගනු ලබන ලංසුකරු ආපනශාලාව පවත්වාගෙන යනු ලබන කාලය ආවරණය වන පරිදි අමාත්‍යාංශයේ කොන්දේසිවලට යටත්ව කාර්ය සාධන ඇපකරයක් ලබා දීමට බැඳී සිටිය යුතුය.

10. **ලංසුකරුවන්ගේ සුදුසුකම්**

10.1 පහත සඳහන් ව්‍යවසායන් ලංසු තැබීම සඳහා සුදුසුකම් ලබයි.

(අ) සීමිත වගකීම් සමාගම්
(ආ) හවුල්කාරිත්වයක් ඇති සමාගම්
(ඇ) තනි ව්‍යාපාර

**10.2 කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍යාංශය පහත සඳහන් පුද්ගලයින්/සමාගම් සලකා බලනු නොලැබේ.**

(අ) මීට පෙර අමාත්‍යාංශය ආපනශාලාවට අදාළ කුලී ගෙවීම් පැහැර හැර ඇති අය.

(ආ) අමාත්‍යාංශය සමග සෘජුව හෝ වක්‍රව ප්‍රදානය කරන ලද ආපනශාලාව පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ අය.

11. මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලියවිලි මෙම අමාත්‍යාංශයේ ගිණුම් අංශයේදී ගාස්තු රහිතව පරීක්ෂා කළ හැකිය.

12. මෙම මිල ගණන් කැඳවීම සම්බන්ධව වැඩි විස්තර දුරකථන අංක 011-2887697, ගිණුම් අංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබාගත හැකිය.

**ලේකම්,**
**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,**
**18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.**
**2025.06.25**